

(මෙම පරිච්ඡේදයේ අවසානයේ දී මෙම ඡායාරූපය පිළිබඳ අනාවරණ අධ්‍යයනයක් පළ වේ.)

# 6

# අනාවරණය

මේ වන විට සොයාගෙන ඇති සියලුම කැමරා තාක්ෂණයන් ප්‍රයෝජනයට ගනිමින් ඩිජිටල් කැමරාව නිපදවා ඇත. ප්‍රලිඛිත අනාවරණය (Program Exposure) හෝ සම්පූර්ණ ස්වයංක්‍රීයතාවය (Auto) භාවිත කර අනාවරණයෙන් නිවැරදි ඡායාරූපයක් ලබා ගැනීම ලෝකවාසී සෑම මනුෂ්‍යයෙකුගේම වරප්‍රසාදයක් බවට පත්ව ඇත.

ගත් ඡායාරූපය ඒ මොහොතේම නරඹා, එහි යහගුණ ඒ වෙලේම දක ගැනීමට හැකි වීම නිසාත්, එහි යම් දෝෂයක් තිබුනේ නම් එවේලේම නැවත ගැනීමට හැකි වීම නිසාත්, ආලෝක තත්වයෙන් නිවැරදි ඡායාරූපයක් ලබා ගැනීම පහසු කාර්යයක් වී තිබේ. කැමරාවක් මිල දී ගැනීමේ දී ලැබෙන උපදෙස් පත්‍රිකාව කියවා අවබෝධ කර ගැනීමෙන් ඕනෑම කෙනෙකුට නිවැරදි අනාවරණයක් ලබා ගත හැක.

නිර්මාණාත්මක හෝ කලාත්මක ඡායාරූපයක් නිමකරන්නට අවශ්‍ය කෙනෙකුට ඊට වඩා වැඩි අධ්‍යනයක් ඕනෑ කෙරේ. මෙම